## <u>අයදුම් පත්‍ර එවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු</u>

### <u>පොදු උපදෙස්</u>

- රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අ.පො.ස.(උසස්පෙළ ) පන්ති සඳහා ඇතුළත් වීමේ අයදුම් පත්‍ර අප විද්‍යාලයේ විද්‍යුත් ලිපිනයට ගෙන්වා ගැනීමට තීරණය කර ඇත.
- අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සෑම විටම නිවැරදි තොරතුරු පමණක් සඳහන් කළ යුතුයි.
- අසම්පූර්ණ අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම් පත්‍ර එවීමේ දී සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යය අයදුම් පත්‍ර අතුරින් එකක් පමණක් භාවිතා කළ යුතුයි. සෑම අයදුම් පත්‍රයක්ම pdf ගොනුවක් ලෙස සුරක්ෂිත කර (Save) එවිය යුතු වේ.
- අදාල විෂය ධාරාවන් හා මාධ්‍යය තෝරා ගත යුත්තේ දී ඇති උපදෙස් වලට පමණක් බව සලකන්න.
- සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම් පත්‍රයේ මුල් පිටපත සමඟ ඔබගේ සහතික වල ඡායා පිටපත් සහිත ගොනුවක් පාසලට භාර දිය යුතු අතර ,සෑම සහතිකයකම මුල් පිටපත එදිනට ඉදිරිපත් කළ යුතුවේ.
- ඔබ විසින් එවනු ලබන විද්‍යුත් තැපැල් පණිවිඩයේ මාතෘකාවෙහි විෂය ධාරාව, මාධ්‍යය සහ මුලකුරු සමඟ නම අනිවාර්යයෙන් සටහන් කළ යුතු බව සලකන්න.
- සම්පූර්ණ කරනු ලබන අයදුම් පත් anula.al2022@gmail.com යන විද්‍යුත් ලිපිනයට 2020.05.30 දිනට පෙර එවිය යුතු වේ.

### <u>විෂයයන් හා මාධ්‍යය තෝරා ගැනීම සඳහා උපදෙස්</u>

- විද්‍යා අංශය විෂය ධාරාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන් වලින් පැවැත්වේ.
  - ජීව විද්‍යාව/ සංයුක්ත ගණිතය
  - භෞතික විද්‍යාව / කෘෂි විද්‍යාව (සිංහල මාධ්‍යය පමණි )
  - රසායන විද්‍යාව / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

- වාණිජ්‍යය අංශය විෂය ධාරාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන් වලින් පැවැත්වේ.
  - ආර්ථික විද්‍යාව
  - ගණකාධිකරණය
  - ව්‍යාපාර අධ්‍යයනය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / ව්‍යාපාර සංඛ්‍යානය (සිංහල මාධ්‍යය පමණි )

- කලා විෂය ධාරාව සඳහා විෂයයන් තෝරා ගැනීම පහත උපදෙස් වලට අනුව සිදුකළ යුතුයි.
  - කලා විෂය ධාරාව සමාජ විද්‍යා, භාෂා , සෞන්දර්ය යන අංශ තුන ඔස්සේ ක්‍රියාත්මක වේ. එක් ශිෂ්‍යාවකට තෝරා ගත හැක්කේ එක් අංශයක් පමණි. තමා තෝරාගත් අංශය යටතේ 1,2,3 කාණ්ඩවලින් විෂයයන් තුනක් තෝරාගත යුතු වේ. එක් කාණ්ඩයකින් තෝරාගත හැක්කේ එක් විෂයයක් පමණි. එක් කාණ්ඩයකින් විෂයන් දෙකක් හෝ තුනක් තෝරා ගත නොහැකියි. එහිදී චක්‍ර ලේඛනයෙහි දැක්වෙන උපදෙස් අනුව පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

- ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව,ඉතිහාසය , ගෘහ ආර්ථික විද්‍යාව, මාධ්‍ය අධ්‍යයනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර සංඛ්‍යානය, දේශපාලන විද්‍යාව,තර්ක ශාස්ත්‍රය යන විෂයයන් සමාජ විද්‍යා/ ව්‍යවහාරික සමාජ විද්‍යා යන කාණ්ඩයට අයත් වන අතර ශිෂ්‍යාවන් අවම වශයෙන් එයින් එක් විෂයයක් හෝ තෝරා ගත යුතුයි. අවශ්‍ය නම් විෂයයන් තුනම එම විෂයයන් අතුරෙන් තෝරා ගත හැකියි.
- එහෙත් භාෂා විෂයයන් දෙකක් හා තුන්වන විෂය ලෙස බෞද්ධ ශිෂ්ටාචාරය විෂය හෝ සෞන්දර්ය විෂයයක් තෝරාගත් අයෙකුට සමාජ විද්‍යා/ ව්‍යවහාරික සමාජ විද්‍යා විෂයයක් තෝරාගැනීම අනිවාර්ය නොවේ.
- චිත්‍ර , නර්තනය, සංගීතය , නාට්‍ය හා රංග කලාව යන විෂයයන් තෝරා ගන්නා අයෙකුට අ.පො.ස. (සා. පෙළ ) විභාගයෙන් එම විෂයයට " C "සාමාර්ථයක් තිබීම අවශ්‍ය වේ.
- සිංහල, හින්දි, ඉංග්‍රීසි, ප්‍රංශ, ජපන් භාෂා කාණ්ඩවලට අයත් වන අතර එම භාෂා අතුරෙන් තෝරා ගත හැක්කේ විෂයයන් දෙකක් පමණි.

**සමාජ විද්‍යා අංශය**

***1 වන කාණ්ඩය***

සිංහල
භූගෝල විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සිංහල )
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි )

***2 වන කාණ්ඩය***

මාධ්‍ය අධ්‍යයනය
තර්ක ශාස්ත්‍රය
ඉතිහාසය
ගෘහ ආර්ථික විද්‍යාව

***3 වන කාණ්ඩය***

ආර්ථික විද්‍යාව(සිංහල )
ආර්ථික විද්‍යාව(ඉංග්‍රීසි )
දේශපාලන විද්‍යාව
බෞද්ධ ශිෂ්ටාචාරය

**භාෂා අංශය**

***1 වන කාණ්ඩය***

සිංහල
භූගෝල විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සිංහල )
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි )
ඉංග්‍රීසි

***2 වන කාණ්ඩය***

මාධ්‍ය අධ්‍යයනය
තර්ක ශාස්ත්‍රය
ඉතිහාසය
ගෘහ ආර්ථික විද්‍යාව

***3 වන කාණ්ඩය***

ආර්ථික විද්‍යාව(සිංහල )
ආර්ථික විද්‍යාව(ඉංග්‍රීසි )
දේශපාලන විද්‍යාව
ප්‍රංශ
ජපන්

**සෞන්දර්ය අංශය**

***1 වන කාණ්ඩය***

සිංහල
භූගෝල විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සිංහල )
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි )
නාට්‍ය හා රංග කලාව

***2 වන කාණ්ඩය***

මාධ්‍ය අධ්‍යයනය
තර්ක ශාස්ත්‍රය
ඉතිහාසය
ගෘහ ආර්ථික විද්‍යාව
හින්දි

***3 වන කාණ්ඩය***

ආර්ථික විද්‍යාව(සිංහල )
ආර්ථික විද්‍යාව(ඉංග්‍රීසි )
දේශපාලන විද්‍යාව
බෞද්ධ ශිෂ්ටාචාරය
නර්තනය
පෙරදිග සංගීතය
චිත්‍ර